# ශ්‍රී ලංකාවේ අභිලේඛනවලින් හෙලිවන අතීත පරිසර සංරක්ෂණය සහ වර්තමාන පරිසර විනාශය පිළිබඳ අධ්‍යයනයක්

ආර්.පී. ලක්මාලි*, එච්.ජී.ඩී.එම්. රාජපක්ෂ

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
pradeepal337@gmail.com*, madhushanirajapakshe0076@gmail.com

**මුඛ්‍ය පද** - අභිලේඛන, පරිසර සංරක්ෂණය, වර්තමානය

## හැඳින්වීම

දකුණු ආසියාතික රටක් වන ශ්‍රී ලංකාව ජෛව විවිධත්වයෙන් අනූන රටකි. නිවර්තන කලාපයේ පිහිටීම, භූගෝලීය විවිධත්වය වැනි කරුණු නිසා පරිසර පද්ධතීන් විශේෂ හා ජානමය වශයෙන් ඉහළ ජෛව විවිධත්වයකින් සමන්විත ය. මහින්දාගමනයට පෙර යුගයේ සිට ප්‍රාග් මානවයා වෘක්ෂ  වන්දනය,  සත්ත්ව වන්දනය, ස්වාභාවික වස්තු වන්දනයෙහි යෙදී ඇත. එමඟින් පැහැදිලි වන්නේ පරිසරය දේවත්වයෙන් සලකා වැඳුම් පිදුම් කර ඇති බවයි. ලාංකේය මිනිසා පරිසරය ආරක්ෂා කරගනිමින් සංරක්ෂණය කළ අතර පරිසර විනාශයක් සිදු නො කිරීමට වග බලා ගත් බව සෙල්ලිපි අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. එසේ විනාශ කළහොත් ඒවාට ලබා දෙන දඬුවම් සහිත නීති පද්ධතියක් ද පැරැණි මුතුන්මිත්තන් අතර ක්‍රියාත්මක වී ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ පරිසර සංරක්ෂණ විෂයෙහි පැරැණ්නන් ලබා දුන් දායකත්වය හඳුනා ගැනීමයි. අතීත පරිසර සංරක්ෂණ ක්‍රමෝපායන් වර්තමාන පරිසර සංරක්ෂණය සඳහා යොදා ගත හැකි ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි.

## ක්‍රමවේදය

දත්ත එක්රැස් කිරීමට ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් අදාල සෙල්ලිපි කිහිපයක තොරතුරු ලබා ගත් අතර පුස්තකාලය ආශ්‍රයෙන් ද්විතියික මූලාශ්‍රයන්හි තොරතුරු ද සහිතව මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

අතීතයේ අප රටේ තිබූ ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාව, මහා පරිමාණ කර්මාන්ත, කලා ශිල්පයන්ගේ සංවර්ධනය ආදී වූ සියලු දේ මඟින් පැරැණ්නෝ පරිසරය සමතුලිතතාව පවත්වා ගැනීමට සමත් විය. අවිහිංසාව, භක්තිය, බිය, තැතිගැනීම පරිසරය ආරක්ෂා කිරීමට හේතු වන්නට ඇතැයි සිතිය හැකිය. අතීත රජවරු, ප්‍රභූවරු ආදීන් භික්ෂූන් වහන්සේලාට ගල් ලෙන් පූජා කර ඇත. බොහෝ විට මෙම ගල්ලෙන් වනාන්තර ආශ්‍රිතව තිබෙන ඒවාය. "කුබිර - තෙරහ වනෙ" කුබිර (කුවේර) තෙරුණ්ගේ වනයයි. මෙසේ සඳහන් වන්නේ අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රදේශයේ ඇති සෙල්ලිපියක ය. කුවේර නම් භික්ෂුව හට මෙම වනය පූජා කළ බව එම සෙල්ලිපි අනුව පැහැදිලි කරයි. එමෙන් ම වව්නියාව දිස්ත්‍රික්කයේ මහකච්චට්කෝඩි ශිලා ලිපියෙහි දැක්වෙන්නේ "බත අබයහ ලෙනෙ ශගශ" (භර්තෘ අභය ගෙ ලෙන සංඝයාට ය). සිතුල්පව්ව කොරවක්ගල ඇති සෙල්ලිපියක සඳහන් වන්නේ "ගුතහ මහලෙණෙ අගත අනගත චතුදිශ-ශගශ" (ගුත්තගේ ලෙණ ආ නොආ සතරදිග සංඝයාට ය)

මෙම සියලු සෙල්ලිපිවලින් තහවුරු වන්නේ භික්ෂූන් වහන්සේලාට පූජා කළ ලෙන් පිළිබඳව ය. මෙකී ලෙන් ගස් ගල් සහිත වනාන්තර බද ප්‍රදේශයක පිහිටා තිබීම සුවිශේෂී වේ. ආරණ්‍යය සෙනසුන් නමින් පසුකාලීනව හඳුන්වනු ලබන්නේ මෙසේ පූජා කළ ලෙන් ආරාම සහිත වන බිම් ප්‍රදේශයන් ය. මෙසේ පූජා කළ ආරණ්‍යය ප්‍රදේශ නිතැතින් ම ආරක්ෂා වී ඇත්තේ ඒවා සංඝයාට කරන ලද පූජාවන් හෙයිනි. මොරගොඩ වැම් ලිපියෙහි විහාර ආරාමවලට අයත් දෑ ප්‍රයෝජනයට ගන්නා අය බල්ලන් කපුටන්ව ඉපදෙන බව සඳහන්

කරයි. එසේ සඳහන් කිරීමෙන් යම් භීතියක් මිනිසුන් තුළ ජනිත කරවයි. මෙය එක් පැත්තකින් පරිසර සංරක්ෂණයට ගත් උපක්‍රමයක් ලෙස සැළකිය හැකි ය. පස්වන කාශ්‍යප රජු විසින් කරවන ලද අභයගිරි පුවරු ලිපියෙහි ද සඳහන් කරනු ලබන්නේ අභයගිරි විහාරයට, චේතියගිරි විහාරයට, ඇතුළු විහාර ගම් බිම්වලට, ආබද්ධ රජ මහා විහාරයට, පිරිවෙන, මෙහෙණි ආරාමවලට ආදි වූ සංඝයා සතු සියලු ගම්බිම්වලට අයත් ගස් වැල් නොකැපිය යුතු බව එම ශිලා ලේඛනවලින් දක්වා ඇත. පුලියම්කුලම් පුවරු ලිපියෙහි, මිහින්තලා පුවරු ලිපියෙහි ගස් නොකැපිය යුතු බවත්, මී ගස් සහ තල් ගස් නොකැපිය යුතු බවත් දක්වා ඇත. තෙවන උදය රජු විසින් (ක්‍රිස්තු වර්ෂ 964 - 972) කරන ලද බදුලු ටැම් ලිපියෙහි "දෙමුළැ බද් වල් වැල දඬුපත් නොකපනු කොට ඉසා මෙහෙකරුවනට ආකුල නොකරනු ඉසා..." යනුවෙන් නිකාය දෙකකට අයත් කැලෑ සහ ඒවායේ වැඩ කරන සේවක පිරිස් හට ද හිරිහැර නොකළ යුතු බව සඳහන් කර ඇත. හතරවන මිහිඳු රජු විසින් කරවන ලද වේවැල්කැටිය සෙල්ලිපිය, නිශ්ශංකමල්ල රජු විසින් කරවන ලද අනුරාධපුර සෙල් ලිපිය මඟින් සතුන්ට අභය දානය ලබා දිය යුතු බව, සතුන් මැරීම සිදු කළ හොත් අත්පා කැපීම, මරණීය දණ්ඩනය වැනි නීති මාලාවක් ද ක්‍රියාත්මක වී තිබුණි. දහවන ශත වර්ෂයට අයත් කතෘ පිළිබඳ සඳහන් නොවන ගල් ඔරුවේ සන්නසේ එළුවන් මැරීම වරදක් සේ සලකා ඇත. දඹුලු ගිරි ලිපියෙහි ද සතුන් මැරීම තහනම් කර ඇත.

උක්ත කරුණු සියල්ලන්ගෙන් ම පෙනී යන්නේ පැරණි මුතුන් මිත්තන් බුදුරදුන් ප්‍රමුඛ සංඝයා කෙරෙහි ඇති ශ්‍රද්ධාව, අකුසලයට  බිය වීම, අවිහිංසාව, නීතියට බිය වීම සහ නීති ආරක්ෂා කිරීම වැනි හේතූන් මත පරිසරයට අයත් ගස්වැල්  ආදිය මෙන් ම සත්ත්ව සම්පත ද ආරක්ෂා කර ඇති බවයි. ශාකමය ආහාර, ඖෂධ, ජල සම්පත වැනි බොහෝ ප්‍රයෝජන ලබා දෙන්නා වූ පරිසරය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීමට කටයුතු කර ඇති බව ගම්‍ය වේ.

මුල් කාලීනව මානවයා හා පරිසරය අතර පැවතියේ ඉතා සරල සම්බන්ධතාවයකි. එයින් මානව, පරිසරය යන දෙපාර්ශවයටම ම සිදු වූයේ අවම හානියකි. එයට හේතුව එකල මිනිසාට සීමිත අවශ්‍යතා ප්‍රමාණයක් පැවතීම යි. එම අවශ්‍යතා පරිසරයට උසුලා ගත හැකි තරම් සරල විය. ඔවුන් පරිසර සංරක්ෂණයෙහිලා කැපවී සිටියහ. වර්තමානයේ ජනගහනයේ සීඝ්‍ර වර්ධනයත් සමඟ මිනිස් අවශ්‍යතාවල අසීමිත වර්ධනයක් සිදුවීමක් සිදු වන අතර එම අවශ්‍යතා ඉටු කර ගැනීමේ සීඝ්‍රතාව මෙන් ම ඒ සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදයන් ද පරිසරයට උසුලාගත නොහැකි තරම් ධාරිතාවක් බවට පත් වේ. මේ හේතුවෙන් පරිසරය සංරක්ෂණය වෙනුවට සිදු වූයේ පරිසරය දූෂණය වීමකි. කාර්මීකරණය, නාගරීකරණය යන සමාජ ආර්ථික විපර්යාසයන් සමඟ සිදුවන කර්මාන්ත ශාලා ඇති වීම, ලෝක යුද තත්ත්වයන් හා න්‍යෂ්ටික අවි ආයුධ නිෂ්පාදනය හා භාවිත කිරීමේ තත්ත්වයන් මඟින් ඉතාම හානිදායක තත්ත්වයක් පරිසරයට ඇති වේ.

මෙසේ විනාශ වන පරිසරය හේතුවෙන් කාන්තාරීකරණය, ජල හිඟය, වසංගත රෝග, අම්ල වැසි යන තත්ත්වයන්ට වර්තමානයේ මිනිසුන් මුහුණ දෙමින් සිටී. විවිධ පරිසර සංරක්ෂණ පණත්, සමුළු, සම්මුති, නීතිරීති ඇති කළ ද පරිසර විනාශයේ අඩුවක් සිදු නොවන තරම් ය. වායු, ජල, වන දූෂණය පමණක් නොව සත්ත්ව හිංසනය උපරිම වශයෙන් වර්තමානයේ සිදුවන බව පෙනේ. උක්ත කරුණුවලට අනුව අභිලේඛනවල සඳහන් පරිසර සංරක්ෂණය විනාශ කිරීමකි. එහි අනිටු ප්‍රතිඵල මිනිසා ක්‍රම ක්‍රමයෙන් භුක්ති විඳිමින් සිටින බව ද විද්‍යාමාන වන කරුණකි. අභිලේඛනවල සඳහන් මරණීය දණ්ඩනය, දැඩි නීති මාලාව, යහපත් ආකල්ප වර්ධනය වර්තමානයෙහි ද ක්‍රියාත්මක වන්නේ නම් යම් ප්‍රමාණයකින් හෝ පරිසරය ආරක්ෂා කර ගත හැකි වේ යැයි සිතිය හැකිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

අමරවංශ හිමි, කොත්මලේ, (1969). ***ලක්දිව සෙල්ලිපි,*** කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඒකනායක, ඇකිරියගල එච්. ඒ. (2006). ***රොබට් නොක්ස් දුටු ලංකාව***, කොළඹ, ඇස් ගොඩගේ සහෝදරයෝ.

කුලතුංග, ටී. ජී. (2005). ***අභිලේඛන ශාප පාඨ***, මහරගම, තරංජී ප්‍රින්ටර්ස්.

ධනපාල, ඒ.එච් (2010). ***පරිසර විනාශය හා සංරක්ෂණය***, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ.

මුදියන්සේ, එන්. (2006) ***සිංහල ශිලා ලේඛන සංග්‍රහය,*** කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.